*සැ. යු.* - මෙවර පළවන ගැසට් පත්‍රයේ VI වන කොටසේ 2024 වර්ෂය සඳහා මහනුවර දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,401 - 2024 සැප්තැම්බර් මස 06 වැනි සිකුරාදා - 2024.09.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | 350 |
| පිස්කල් විකිණීම් ... ... ... | — |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2024 සැප්තැම්බර් මස 27 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 සැප්තැම්බර් මස 13 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## කොළඹ වාණිජ මහාධිකරණයේ දී ය

## දඹුල්ල ඉනාමළුවේ පිහිටි අලුත් සංචාරක නිවාස 2ක් සහිත අක්කර 1ක් විශාල ඉඩමක් පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී,
බෑන්ක් ඔෆ් සිලෝන් මර්චන්ට් ටවර්,
අංක 28, ශාන්ත මයිකල් පාර, කොළඹ 03.
*පෙර* : එම්. සී. එස්. එල්. ෆයිනෑන්ෂියල් සර්විසර්ස් ලිමිටඩ්,
*පෙර* : මර්චන්ට් ක්‍රෙඩිට් ඔෆ් ශ්‍රී ලංකා ලිමිටඩ්,
ලංකා බැංකු මර්චන්ට් කුළුණ, 11 වන මහල, අංක 28, ශාන්ත මයිකල් පාර, කොළඹ 03.

නඩු අංකය : HC (Civil)/308/12/MR

.................*පැමිණිලිකරු.*

දඹුල්ල දිසා අධිකරණයේ
ඇස්කීසි අංකය : 09/2024

*එදිරිව*

1. සීගිරිය වයිස්රෝයි හොටෙල් (පුද්.) සමාගම
2. රන්හොටිගේ සුලලිත ශාන්ත කුමාර සේනානායක

*දෙදෙනාම* : අංක 06, පානාම්බලන මාවත, මීගමුව පාර, කුරුණෑගල.

.................*විත්තිකරුවෝ.*

කොළඹ වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති දේපළ විකිණීමේ අධිකාරී පත්‍රයට අනුව ඉහත විත්තිකරුවන්ගෙන් පැමිණිලිකරුට අයකර ගැනීමට ඇති රු. 47,135,137.66ක මුදලක් සහ ඒ මත 2012.03.14 දින සිට සම්පූර්ණ මුදල ගෙවා අවසන් වන තෙක් මසකට සියයට හතරක් (4%) බැගින් පොලිය ද නඩු ගාස්තු ද අයකර ගැනීම සඳහා අණකොට මෙහි පහත උපලේඛනවල වඩාත් විස්තර වන දඹුල්ල, ඉනාමළුව, සීගිරිය මාර්ගයේ පිහිටි කාමර 4 බැගින් ඇති අලුත් දෙමහල් ගොඩනැගිලි 2ක් සහිත ගල්කොටුව යාය *හෙවත්* තල් කොටුව යාය නමැති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන ලෙසට මා වෙත නියෝග කොට ඇති බැවින් එම දේපළේ වෙන්දේසිය,

**2024 ඔක්තෝබර් මස 24 දින පෙ. ව. 11.30 ට,**

එකී දේපළ පිහිටි ස්ථානයේ මවිසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

*දේපළට පිවිසෙන මාර්ගය.-*

දඹුල්ල නගරය පසුකර ත්‍රිකුණාමල පාරේ, කිලෝමීටර 8ක් පමණ ගොස් ඉනාමළුව හන්දියෙන් සීගිරිය මාර්ගයට හැරී කි. මී. 1 1/2 පමණ ගිය විට එම පාරට ම මුහුණලා වම් පැත්තට වන්නට මෙම දේපළ පිහිටා තිබේ.

*වෙන්දේසියේ දී ගෙවීමේ ක්‍රමය.-*

වෙන්දේසිය අවසන් වූ වහාම දඹුල්ල දිසා අධිකරණයේ අතිරේක රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් වන මා වෙත පහත දැක්වෙන පරිදි මුදල් ගෙවිය යුතු ය. සියලුම ගෙවීම් මුදලින් හෝ බැංකු අණකර මගින් පමණක් ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ :

01. සම්පූර්ණ විකුණුම් මුදලින් සියයට විසිපහක (25%) මුදලක් එවලේ ම මා වෙත ගෙවිය යුතු ය. ඉතිරි සියයට හැත්තෑපහක (75%) මුදල වෙන්දේසි දින සිට දින තිහක් (30) ඇතුළත දඹුල්ල දිසා අධිකරණයේ ඉහත ඇස්කීසි අංක දරන නඩුවට තැන්පත් කළ යුතු ය,

02. මීට අමතරව සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය යටතේ වන පිස්කල් ගාස්තු ද එම අවස්ථාවේ දී ම මා වෙත ගෙවිය යුතු ය.

**උපලේඛනය**

01. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ ඉනාමළුව කෝරලේ ඉනාමළුවේ පිහිටි ගල්කොටුව යාය *හෙවත්* තල්කොටුව යාය නැමති ඉඩමට වර්ෂ 2004 ජනවාරි මස 15 වැනි දින ඒ. එම්. අනුරරත්න බලයලත් මානකතැන විසින් මැන සාදන ලද අංක 2531 දරන පිඹුර ප්‍රකාරව කැබලි අංක A දරන ඉඩම් කැබැල්ලට මායිම් : උතුරට : රජයට අයත් මූකලාන ද, නැගෙනහිරට : කැබලි අංක B ද, දකුණට : ඉනාමළුව සිට සීගිරිය දක්වා පාර සඳහා වෙන් කරන ලද කොටස සහ බටහිරට : එච්. එම්. රංබණ්ඩාට අයත් ඉඩම යන මායිම් තුළ වූ රූඩ් දෙකක් (රූ. 02) විශාලත්වයෙන් යුත් ඉඩම් කැබැල්ල සහ එය තුළ පිහිටි ගහකොළ පලතුරු ආදී සියලු දේ ද වේ. මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LODD 114/290 දරන පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත.

02. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ ඉනාමළුව කෝරලේ ඉනාමළුවේ පිහිටි ගල්කොටුව යාය *හෙවත්* තල්කොටුව යාය නමැති ඉඩමට වර්ෂ 2004 ජනවාරි මස 15 වැනි දින ඒ. එම්. අනුරරත්න බලයලත් මානකතැන විසින් මැන සාදන ලද අංක 2531 දරන පිඹුර ප්‍රකාරව කැබලි අංක B දරන ඉඩම් කැබැල්ලට මායිම් : උතුරට : රජයට අයත් මූකලාන ද, නැගෙනහිරට : මහින්ද රත්නායකට අයත් ඉඩම ද, දකුණට : ඉනාමළුව සිට සීගිරිය දක්වා පාර සහ බස්නාහිරට : කැබලි අංක A යන මායිම් තුළ වූ රූඩ් දෙකක් (රූ. 02) විශාලත්වයෙන් යුත් ඉඩම් කැබැල්ල සහ එය තුළ පිහිටි ගහකොළ පලතුරු ආදී සියලු දේ ද වේ. මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LODD 114/291 දරන පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත.

අතිරේක රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය - දඹුල්ල.

2024 අගෝස්තු මස 09 වැනි දින,
දඹුල්ල දිසා අධිකරණයේ දී ය.

09-35

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2024 වර්ෂය** | | | |
| **සැප්තැම්බර්** | 2024.09.06 | සිකුරාදා | 2024.08.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.09.13 | සිකුරාදා | 2024.08.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.09.20 | සිකුරාදා | 2024.09.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.09.27 | සිකුරාදා | 2024.09.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ඔක්තෝබර්** | 2024.10.04 | සිකුරාදා | 2024.09.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.10.11 | සිකුරාදා | 2024.09.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.10.18 | සිකුරාදා | 2024.10.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.10.25 | සිකුරාදා | 2024.10.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| **නොවැම්බර්** | 2024.11.01 | සිකුරාදා | 2024.10.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.11.08 | සිකුරාදා | 2024.10.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.11.14 | බ්‍රහස්පතින්දා | 2024.11.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.11.22 | සිකුරාදා | 2024.11.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.11.29 | සිකුරාදා | 2024.11.14 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.